# ඇදිසී

### ජගත් ජේ එදිරිසිංහ ලියයි



අනුරාධපුරය යට කර දමන්නට මෙන් මහා වැස්සක් ඇද වැටෙයි. රණසිංහ නින්දෙන් පිබිදුණේ අහස ගොරවන හඬට ය. තානායම් කාමරයේ කවුළුව තිර මෑත් කළ ඔහුට වැහි දිය වැව් දිය තලය මතට වැටෙන සැටි මැනැවින් පෙනෙයි. වැහි වළා මුවාව නිසාවෙන් තවමත් දිනය අරඹන්නට හරි හැටි හිරු රැස් වැටී නැත. වැව් තලාවට ඔබ්බේ අහසේ විදුලිය රේඛා වරින් වර ඇඳී මැකී යයි.

ගෝනියක් වැනි ආවරණයක් හිසේ දමාගත් මිනිසෙක් වැව් කණ්ඩිය මත ගමන් කරමින් සිටියි. හණ කැඩුණ කුඩයක් ඔසවාගෙන ඔහු පසු පසින් දුවන කෙසග කොළුවා ඔහුගේ පුතා විය යුතු ය.

තිර රෙද්ද අතහැර නැවත ඇඳේ දිග ඇදෙන රණසිංහ පෙරදා රැයේ බිව් මත්පැන් නිසාවෙන් රිදුම් දෙන හිස දකුණතින් සම්බාහනය කරගන්නට උත්සාහ කරයි. රැය පුරා මේ සයනයේ තමාට තුරුළුව සිටි සකුන්තලා යන්නට ගියේ කීයටදැයි ඔහුට නිච්චි නැත. ඈ ගල්වාගෙන සිටි විළවුන් සුවඳ තවමත් කොට්ටයේ රැඳී ඇතුවා සේ ය.

"මේ රටේ මිනිස්සු ඔයාලට මේ හැටි රැවටිලා ඉන්නෙ ඇයි කියල මට තේරෙන්නෙ නැහැ.." ඇය කී හැටි ඔහුට සිහිපත් වෙයි.

"ඔයා රැවටුණ විදිහටම තමයි.." ඔහුගේ පිළිතුර ඒ තරම් සරළ විය.

ඕ සිනාසුණා ය.

"දවල්ට පාර්ලිමේන්තුවට වෙලා එහෙමත් නැත්නම් ස්ටේජ් වලට වෙලා දෙගොල්ලන්ට බැණ අඬ ගහ ගන්නවා.. අහගෙන ඉන්න මිනිස්සු හිතන් ඉන්නෙ මූණට මූණ ගැහුණොත් මේ දෙතුන්ගොල්ල මරා ගනියි කියලා..රෑට ඔක්කොම එකතු වෙලා කරට අත දාගෙන පාටි දානවා.. කනවා බොනවා.. සින්දු කියනවා.. නටනවා... දෙතුන්ගොල්ලන්ටම මහජනතාව අමතකයි ඒ වෙලාවට... මේක මහා රඟපෑමක් නේද..?"

"ඒක තමයි මේ රස්සාවෙ හැටි.. "

"හැබෑව නේන්නම්.. මේක දන් රස්සාවක්නෙ.. " ඇගේ ස්වරය සිහිපත් වී ඔහුට දැනුදු සිනා යන්නට එයි. "පිස්සු කෙල්ලෙක්.." ඔහු සිතන්නට උත්සාහ කරයි. සැබැවින්ම ඇය බුද්ධිමත් බව ඔහු දනියි. හමුදා නිළධාරියකු වූ සැමියා මිය ගිය දා සිට බලවතුන්ගේ සමාජයේ පිණුම් ගසන්නට තරම් සුවිශාල ශක්තියක් ඇය ගොඩ නගා ගත්තේ බුද්ධිමත් බව නිසා නොවේ ද?

"ප්‍රතිපත්තිගරුක දේශපාලනයක් කියල දෙයක් දැන් නෑ ඕයි.. දොස්තර වික්‍රමසිංහල ඇන් ඇම්ල යනකොට ඒවත් අරගෙනයි යන්න ගියේ.." ප්‍රඥාරත්න බීමතින් දෙඩවූ හැටි රණසිංහට මතක ය. රණසිංහ වටපිට බලන්නේ කිසිවකු අසා සිටින්නේදැයි සැක හැර ගන්නට ය.

"බයවෙන්ඩ එපා ඕයි.. මෙතන ඉන්නෙ ඔක්කොම හොරු.. උන් නොදන්න අලුත් දෙයක් මං කිව්වෙ නෑ.." ප්‍රඥාරත්න කොක් හඬ දී සිනාසෙයි.

වේලාව දහය පසු වී ඇතැයි රණසිංහට සිතෙයි. වින්ධ්‍යා මේ වන විට නුවරට යන්නට ඇත. ඈ දින කීපයක් මහගෙදර නතර වන්නේ යයි කී බවක් ඔහුට මතක ය. එක අතකින් එය ඇගේ සිතට සහනයක් වනු ඇත. කොළඹ ජීවිතය ඇයට සතුටක් නොවන බව ඔහු දනියි. ඇයට සතුටක් නොදෙන්නේ කොළඹ ජීවිතය නොව තමා සමඟ ගෙවන ජීවිතය බව දෙවනුව ඔහුට සිහිපත් වෙයි. ඒ ගැන අමුතුවෙන් යළි කල්පනා කරන්නට තරම් අලුත් කරුණු කාරණා ඔහුගේ සිත තුළ නැත. මේ සියල්ල දැන් සාමාන්‍ය ජීවිතයේ කොටස් බවට පත්ව ඇත්තා සේ ය. කසාදය නම් වන ගණුදෙනුව අවසානයේ ඉතිරිව ඇති හුදකලා ජීවිත දෙකක් බවට තමන් පත්ව ඇති ආකාරය ගැන පුදුම වන්නට දෙයක් ඇතැයි ඔහුට නොසිතෙයි. මේ සියල්ල මෙසේ සිදුවන්නට නියමව තිබුණා සේ ය.

රණසිංහ ඇඳ මත දිගා වී දෑස් පියාගනියි. කොළඹ යන්නට දැන් හදිසියක් නැත.

0000000

"පුටුවෙ මකුණො ඉන්නවා වගෙයි.. ඉන්ඩ අපේ පොඩි හාමුදුරුවනේ මං වෙනින් පුටුවක් ගේන්නං.." පොඩිනෝනා ගෙතුළට යන්නට සැරසෙන්නේ තිසල්ගේ මේසයේ පුටුව සාලයට ගෙනෙන්නටය.

"කරදර වෙන්න ඕනෙ නෑ උපාසකම්මේ... මකුණොක් කෑවා කියලා මට කරදරයක් වෙන්නෙ නෑ නොවැ.." පොඩිහාමුදුරුවෝ වටාපත ටීපෝව මත තබා වීදුරුවෙන් වතුර උගුරක් බොති. "උඩහ පැල් බැඳගෙන වගිනවාලු.. ඒත් කොළඹ ගිරිස්මෙ නං අඩුවෙන පාටක් නෑ.."

"වගින්නෙ නැති එකමයි කාරිය අපේ හාමුදුරුවනේ.. වැහැලා වැහැලා මේ මළ ජරා ඇළ ගොඩ ගලන්න ගත්තම අපායක්ම තමයි මේක.." පොඩි නෝනා කියන්නේ හැබෑවකි. අන්තිම වතාවට ඇල ගොඩ ගැලුවේ අවුරුදු හතරකට පහකට පෙර දී ය. ගං වතුරට යටවුණ ගොවල් දොරවල් ඇර දමා වැඩි දෙනෙක් පන්සලේ වහලය යටට ආ හැටි පොඩි හාමුදුරුවන්ට හොඳ හැටි මතක ය.

"ඇළ ගොඩ ගලන එකට ඉතිං කරන්ඩ කියල පිළියමකුත් නැහැ නොවැ.."

"සමහර මිනිස්සු ඒකටත් අපේ ලොකු එකාට දොස් කියනවා අපේ හාමුදුරුවනේ.. "

"සුනන්ද මහත්තයට...? ඒ මොකට ද..!"

"මන්ත්‍රී ළඟින්ම ඉඳලත් වත්තට වැඩක් නැහැ කියලා.."

"මන්ත්‍රීට පුලුවන්ද ඇළ ගොඩ ගලන එක නවත්තන්ඩ...?"

"කාට කියන්නඩ ද..?"

"සුනන්දයියා.." පාරේ සිට කිසිවකු කෑ ගසයි. ඒ බණ්ඩාරගේ කටහඬ බව පොඩි නෝනා දනියි.

"ගෙදර නෑ පුතේ.." ඕ දොරකඩ සිට කෑ ගසයි. කොලු නඩයක් වටකොටගෙන සිටින බණ්ඩාරට ඇගේ කටහඬ මැනැවින් නෑසේ. එනමුදු ඈ කියූ දේ මේ යයි ඔහු අනුමාන කරගනියි.

"අද හවස අපේ වතු රැස්වීම.. සුනන්දයියත් හිටිය නම් තමයි හොඳ.." ගේට්ටුව ඇරගෙන වත්තට ඇතුල්වන බණ්ඩාරගෙ " කටහඬෙහි ඇත්තේ බලාපොරොත්තු කඩ වූවාක් වැනි ස්වරයකි. ".. අපේ හාමුදුරුවොත් ඉන්නෙ.." පොඩි හාමුදුරුවන් දෙපා නමදින බණ්ඩාර දොර පඩිය මත වාඩි වෙයි. උළුවස්සට පිට තබා ගන්නා ඔහුගේ මුහුණ දහඩියෙන් තෙමී ඇති සැටි පොඩි හාමුදුරුවෝ දකිති. අවුල්ව ගිය පොකුටු කොණ්ඩයෙන් යුත් බණ්ඩාරගේ මුහුණේ ඇත්තේ විශාල උද්යෝගයකි. මහන්සියක් නොදැනෙන්නා වාගේ ය.

"බීපන් පුතේ.." පොඩි නෝනා ඔහුගේ ඉල්ලීමකින් තොරවම ඔහු අතට වතුර වීදුරුවක් දෙයි.

"වැඩ අහවරයි ද මහත්තයා..?" උගුරට දෙකට වතුර වීදුරුව බොන බණ්ඩාර දෙස බලා සිටින පොඩි හාමුදුරුවෝ අසති.

"සැරසිලි වැඩ නම් ඉවරයි අපේ හාමුදුරුවනේ.. සහෝදරවරු ටික ඒව ඔක්කොම නියමෙට කළා.. මම ටිකක් එහේ මෙහේ ගිහින් හොයලා බැලුවා විතරයි.." බණ්ඩාර හිස් වතුර වීදුරුව පොඩිනෝනා අතට දෙයි. "..දැන් ලොකු හාමුදුරුවන්ගේ තත්වෙ කොහොමද අපේ හාමුදුරුවනේ.. ?"

බණ්ඩාර මේ විමසන්නේ කුමක්දැයි පොඩි හාමුදුරුවන්ට වැටහෙයි. එහෙත් ඒ ගැන කතා කරන්නට කැමැත්තක් ඔහු සිත තුළ නැත.

"උන්නාන්සේ නං වෙනදා වගේම අප්‍රුරුවට සන්සුන්ව ඉන්නවා..."

"උන්නාන්සේ නං සන්සුන්ව ඉඳියි.. අපේ තමයි ලේ කෝප වෙන්නෙ.."

"වෙනින් කෙනෙක් කරන කියන දේ ගැන ලේ කෝප කරගන්නෙ මොකටද මහත්තයා.."

"සමාවෙන්ඩ අපේ හාමුදරුවනේ.. එහෙම ආත්මාර්ථකාමී විදිහට හිතලා සද්ද වහලා ඉන්ඩ තිබුණා මේවා තම තමන්ගෙ පුද්ගලික වැඩ නම්.. ඒත් අපේ හාමුදරුවනේ මේවා රටේ මහජනතාවගෙ ප්‍රශ්න.. මේව රටේ ප්‍රශ්න.. මේ වැඩ වලින් තැළෙන්නෙ රටේ දුක් විඳින මිනිස්සු.. ඒක දිහා බලාගෙන ඇස් කන් පියාගෙන ඉන්ඩ අපට බැහැ.. ඒකයි මේ අපි දහදුක් විඳින්නෙ.. මේ අපි වෙනුවෙන් නෙවෙයි.. රටේ මිනිස්සු වෙනුවෙන්.." බණ්ඩාර නැගිටියි. තම සිතේ ජනිත කෝපය සඟවන්නට ඔහු උත්සාහ නොකරයි. ".. අපි යනවා අපේ හාමුදුරුවනේ.."

ගේට්ටුවෙන් පිටත කොලු නඩයට එක්වන බණ්ඩාර දෙස පොඩි හාමුදුරුවන් බලා සිටින්නේ සසළ වූ සිතිනි.

"මහත්තය කියන දේ ඇත්ත.." යි කියා කියන්නට නොහැකි වීම මහා බරක් ලෙස උන්වහන්සේගේ සිතේ තැන්පත් වෙයි.

000000

"එයා සුද්දවන්තයෙක් නං මගේ ඉල්ලීම අහක දැම්මට මට තරහක් නෑ.. ඉස්සා වගේ ඔලුවෙ කුණු පුරවගෙන ඉන්න ගමන් අහිත් මිනිස්සුන්ට පිරිසිදුව ඉන්න හැටි කියන එකටයි මට තරහ.." කුසල් ගේ කටහඬ සාලයේ වාඩි වී සිටින සුනන්දට ඇසෙයි. "...රණසිංහ අයිය මහා කුහකයෙක්"

"කොහොම වුණත් අපි උදව් ඉල්ලුවෙ වැරදි වැඩකටනෙ මල්ලි.." ඒ වින්ධ්‍යා ය.

"මස්සිනා මන්ත්‍රී කෙනෙක් වෙලා ඉන්දැද්දි වෙන වෙන පාරවල් වල යන්නෙ මොකටද කියලයි මං එයා ළඟට ආවෙ.. එයා බැහැ කිව්වට මට ඒ වැඩේ කරගන්න වෙන ක්‍රම තියෙනවා.. අක්ක දන්නවනෙ මගේ හැටි.. මං පටන් ගත්ත වැඩක් ලේසියෙන් අතඇරින්නෙ නැහැ.. මං ඔය හෝටලේ හදනවාමයි.. ඔයත් එන්න මා එක්ක එකතු වෙලා මේ වැඩේ කරන්න"

> "දවල්ට පාර්ලිමේන්තුවට වෙලා එහෙමත් නැත්නම් ස්ටේජ් වලට වෙලා දෙගොල්ලන්ට බැණ අඬ ගහ ගන්නවා.. අහගෙන ඉන්න මිනිස්සු හිතන් ඉන්නෙ මූණට මූණ ගැහුණොත් මේ දෙතුන්ගොල්ල මරා ගනියි කියලා..රෑට ඔක්කොම එකතු වෙලා කරට අත දාගෙන පාටි දානවා.. කනවා බොනවා.. සින්දු කියනවා.. නටනවා... දෙතුන්ගොල්ලන්ටම මහජනතාව අමතකයි ඒ වෙලාවට... මේක මහා රඟපෑමක් නේද..?"

සුනන්ද වාඩි වී සිටි පුටුවෙන් නැගිට මිදුලට බසියි. පහළ ගඟ දෙසින් හමා එන සිසිල් සුළඟ ගතට සුවයකි. අව් කූටකයෙන් කරවුණ කොළඹ රළු පරිසරයට වඩා සිත් ගන්නා සුලු බවක් මේ පරිසරයේ ඇතැයි ඔහුට සිතෙයි.
මිදුලේ කෙළවරක ඇති ගල් පඩි පෙළ බැස ගිය විට ගඟ අද්දරට යා හැකි බව සුනන්ද දනියි. මිදුලේ පේර ගසින් ඉදුණ ගෙඩිය දෙකක් කඩා ගන්නා ඔහු එකක් සපමින් පඩිපෙළ බැස පහළට යයි.

පසුගිය දින කීපයේ වට වැස්ස නිසා ගඟ තර වී ඇත. පසුගිය වතාවේ ආ විට දුටු වැලි තලාව දැන් දියෙන් යටව ගොස් ය. පහළ ගල් පඩියක් මත වාඩි වූ සුනන්ද අනිමිස ලෝචනයෙන් ගඟ දෙස බලා සිටියි. ගිනි වැදුණ නගරයට වඩා සැනසිල්ලක් මේ පරිසරයේ ඔහුට දැනෙයි.

36 වන පිටුවට